# කලා උපාධිධාරීන් සම්බන්ධ විරැකියාව

එම්.පී. ලක්ෂානි[1]

## 1. හැඳින්වීම

කලා උපාධිධාරීන් යනු විශ්වවිද්‍යාලය තුළින් පිරිනමන කලා උපාධි පාඨමාලාවට අදාළව සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, භූගෝල විද්‍යාව ආදී පාඨමාලාවන් හා ව්‍යවහාරික විෂයන් යටතට ගැනෙන පුස්තකාල විද්‍යාව හා පුරාවිද්‍යාව යනාදී සමාජයීය විද්‍යාවන්ද, සාහිත්‍යය විෂයන් හා නූතන භාෂා යනාදී මානව විද්‍යා විශයන්ද, තම උපාධි පාඨමාලාව ලෙස හදාරා ඇති විද්‍යාර්ථීන්ය (Lekamwasam, 2021). නමුත් ආර්ථික විද්‍යාවට අනුව රටක ආර්ථික වෘර්ධිය සඳහා මානව ප්‍රාග්ධනය ප්‍රබල බලපෑමක් දක්වන්නේ වුවද, වසර ගණනාවක ආයෝජනයේ ප්‍රතිඵල වශයෙන් බිහිවන කලා උපාධිධාරීන්ගෙන් බහුතරයකට වසර ගණනාවක් ඇවෑමෙන් උකහා ගත් දැනුම හරහා රටට සේවය සැලසීමට නොහැකිවීම තුළින් ආර්ථික වෘර්ධියට මෙම උපාධිධාරීන්ට ධනාත්මකව බලපෑම් කළ නොහැකිවේ. මන්ද යත් සේවා වියුක්තිය ගණනයේදී මුළු රැකියා විරහිත උපාධිධාරීන්ගෙන් 54%ක් කලා උපාධිධාරීන් වේ (Karunarathne & Labour Force Survey, 2019). තවද උපාධිය අවසන් කර ප්‍රථම රැකියාව සඳහා නියුක්ත වීමට වසර දෙකකට වැඩි කලක් ගතවන වැඩිම උපාධිධාරීන් ප්‍රතිශතයක් වාර්තා වන්නේද කලා උපාධිධාරීන්ගෙනි (Gunarathne, Ramanayake & Panagoda, 2018). මෙම තරුණ උපාධිධරයින් හැඳින්වෙන්නේ රටක ආර්ථික සංවර්ධනයේ වර්ධනයට හා ප්‍රසාරණයට අත්‍යාවශ්‍ය ජවසම්පන්න සහ නව තාක්ෂණික අදහස් ඇති පිරිසක් ලෙයසි (Weerasiri & Samaraweera, 2021). මෙම සේවා වියුක්තිය සම්බන්ධයෙන් විවිධ අර්ථකථන පවතී. ඒ අතරින් විරැකියාව සම්බන්ධව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති අර්ථ දැක්වීම අනුව යමින් මෙම පර්යේෂණය සිදු කර ඇත. ඒ අනුව විරැකියාව යනු දැනට රැකියාවක් නොමැති, රැකියාවක් සොයමින් සිටින, සමීක්ෂණයට පෙර සති 4ක කාල වකවානුවකදී රැකියාවක් සෙවීමට කිසියම් පියවරක් ගෙන ඇති, ඉදිරි සති දෙක ඇතුළත ලැබෙන රැකියාවක් භාර ගැනීමේ හැකියාවක් ඇති පුද්ගලයන්ය.

මෙම කලා උපාධිධාරීන්ගේ විරැකියාව සම්බන්ධයෙන් න්‍යායාත්මක පසුබිම විමසා බැලීමේදී සම්භාව්‍ය න්‍යාය හා කේන්සියානු න්‍යාය වැදගත් ස්ථානයක් හිමි කරගනී.

සම්භාව්‍ය න්‍යායෙන් දැක්වෙන්නේ පවතින වැටුප් මට්ටමේදී පුද්ගලයින් රැකියා සොයයි නම්, එම වැටුප් අනුපාතය ඉහළ බවත් එම නිසා සේවා වියුක්තිය අඩු කර ගැනීමට පවතින වැටුප් අනුපාතය අඩු කළ යුතු බවත්ය.

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
prabudunil@gmail.com

නමුත් ශ්‍රමිකයින්ගේ විරෝධය හා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ අකාර්යක්ෂමතා මතුවීම ආදී හේතු නිසා මෙය ප්‍රායෝගිකව ක්‍රියාවේ යෙදවීම අපහසු වේ (රත්නායක, 2002).

සේවා වියුක්තිය සම්බන්ධ කේන්සියානු අදහස නම්, සේවා වියුක්ති තත්තවයක් දැකිය හැකි වන්නේ භාණ්ඩ අතින් සමතුලිත තත්තවයක් ආර්ථිකය අත් කරගෙන ඇති විටයි. එවැනි අවස්ථාවක සාධක වෙළෙඳපොළවල් අනම්‍යතාවන්, ඉල්ලුම් ඌණතාවන් හා ගැලපුම් පිරිවැය නිසා ශ්‍රම වෙළෙඳපොළ සමතුලිත මට්ටමට වඩා අඩු මට්ටමක පවතින බවයි. මෙම විරැකියා තත්ත්වය අවම කර ගැනීමට, ආර්ථිකය සජීවී ලෙස උත්තේජනය කරමින් නිෂ්පාදිතයන්ගේ මෙන්ම ආර්ථික කටයුතුවලද මට්ටම ඉහළ නංවාලීමට කටයුතු කළ යුතුය (රත්නායක, 2002).

නමුදු මෙවැනි ප්‍රසාරණ කාර්‍යයක් ඇතැම් අවස්ථාවල සංකීර්ණ විය හැක. එනම් දිළිඳු රටවල මෙන්ම ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල අනෙකුත් නිෂ්පාදන සාධක වල අඩුවක් පැවතිය හැක. එවිට ආර්ථික කටයුතු ප්‍රසාරණය කිරීම දුෂ්කර වේ. අනෙක් අතට සේවා නියුක්තිය නැංවීමට ක්‍රියාත්මක කරනා ව්‍යාප්තිමය කටයුතු නිසා උද්ධමන තත්ත්වයන් ඇතිවීමට ඉඩ තිබේ.

සාහිත්‍ය විමර්ශනයන්ට අනුව 2020 වසරේදී නිරෝජන් සහ භවන් කලා උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය තීරණය කරන සාධක පිළිබඳව සිදුකරන ලද අධ්‍යයනයට අනුව රැකියාවක නියැලීමෙන් ලද පළපුරුද්ද, රැකියාවේ සුරක්ෂිත තත්ත්වය, උපාධිය හදාරන ලද මාධ්‍යය, පන්ති සාමාර්ථ්‍යය, තොරතුරු තාක්ෂණික දැනුම හා ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය බලපාන බව සොයාගෙන ඇත.

තවද 2021දී කලා හා විද්‍යා උපාධිධාරීන් විරැකියාවෙන් පෙලෙන කාලය තීරණය කරන සාධක පිළිබඳව ගුණරත්න හා ජයසිංහ විසින් සිදුකරන ලද පර්යේෂණයට අනුව පුම්තිරිභාවය, විවාහකත්වය, උපාධි පාඨමාලාවේ ස්වභාවය, උපාධිය හදාරන ලද මාධ්‍යය, බාහිර ක්‍රියාකාරකම්වල නිරත වීම ආදී වූ සාධක බලපාන බව දක්වා ඇත.

2018දී ගුණරත්න, රාමනායක සහ පනාගොඩ විසින් පෙන්වා දෙන පරිදි අනෙක් උපාධිධාරීන්ට සාපේක්ෂව කලා උපාධිධාරීන් නිර්මාණශීලිව සිතීමේ හැකියාව, මෘදු කුසලතා, සන්නිවේදන හැකියාව සහ අන්තර් පුද්ගල සබඳතා යන ගුණාංගවලින් පොහොසත් වේ.

මෙනයින් ගම්‍ය වන්නේ කලා උපාධිධාරීන්ගේ විරැකියාව සඳහා පුම්තිරිභාවය, විවාහකත්වය, රැකියාව බලාපොරොත්තුවන අංශය, ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාව, පරිගණක සාක්ෂරතාව, පන්ති සාමාර්ථය, හදාරන ලද විෂයට අදාළව රැකියාවක් ලබා ගැනීමේ අපේක්ෂාව, උපාධිය හදාරන ලද මාධ්‍යය හා රැකියා පළපුරුද්ද බලපානු ලබන බවයි.

මේ අනුව කලා උපාධිධාරීන්ගේ විරැකියාව කෙරෙහි එකිනෙකට වෙනස් හේතුන් පර්යේෂකයින් විසින් ඉදිරිපත් කර ඇති අතර මේ අනුව කලා උපාධිධාරීන්ගේ විරැකියාව කෙරෙහි නිශ්චිත පිළිතුරක් ලැබී නැත.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

පර්යේෂණයක නිරවද්‍යතාව නිවැරදි දත්ත මත පදනම් වේ. එබැවින් පර්යේෂණ සැලසුම ඉතා වැදගත් වේ. කලා උපාධිධාරීන්ගේ විරැකියාව කෙරෙහි බලපාන සාධක අධ්‍යයනය කිරීමේදී බහුතර පර්යේෂකයින් නිගාමී ක්‍රමවේදය අනුගමනය කර ඇති අතර මෙම අධ්‍යයනයද නිගාමී ක්‍රමවේදය මත පදනම් වේ. එමෙන්ම මෙම විරැකියාව කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණයට ප්‍රාථමික දත්ත උපයෝගී කරගෙන ඇත. ඒ අනුව මෙහිදී ශ්‍රී ලංකාවේ සියළුම සේවා වියුක්ත කලා උපාධිධාරීන් ඉලක්කගත සංගහනය වූ අතර 2019, 2020 වර්ෂවල උපාධිය සම්පූර්ණ කළ කැලණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර පීඨයේ සහ සමාජීය විද්‍යා පීඨයේ සේවා නියුක්ති හා සේවා වියුක්ත මුළු උපාධිධාරීන් ගණන අධ්‍යයන සංගහනය වේ. ඒ අනුව මෙම පර්යේෂණයේ දී නියැදි රාමුවට අදාළ වනුයේ ඉහත වර්ෂයන්හි දී කලා උපාධිය සම්පූර්ණ කරන ලද 2584කින් යුක්ත සංගහනයයි.

මෙම අධ්‍යයනයේ දී සම්භාවිතා නියැඳුම් ක්‍රමයක් වන ස්තෘත නියදීම යටතේ සියලුම ස්ථරවලට සාධාරණ නියෝජනයක් ලැබෙන පරිදි උපාධිධාරීන් 100ක ප්‍රමාණයක් අධ්‍යයනය සඳහා යමානි ක්‍රමය (Yamane Method) අනුව නියැදිය තෝරා ගන්නා ලදී. එහිදී සංගහනයේ නිරූප්‍ය නියැදිය ලෙස 96.27ක ප්‍රමාණයක් තෝරාගත යුතු වූ අතර එම අගය ආසන්න ලෙස 100ක් වශයෙන් ගණන් ගැනුණි.

මෙම අධ්‍යයනයේ දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය යොදා ගෙන ඇත. එහිදී සකස්කරගත් ප්‍රශ්නාවලියේ අඩංගු දත්ත, දත්තදායකයා වෙත ගූගල් ෆෝරමයක් (Google Form) ආධාරයෙන් සම්ප්‍රේෂණය කර තොරතුරු ලබා ගනී. මෙම ප්‍රශ්නාවලියේ ප්‍රශ්න සකස් කිරීම පූර්ව පර්යේෂකයන් විසින් සකස් කරගත් ප්‍රශ්න මත පදනම්ව සකස් කරන ලදී.

පූර්ව පර්යේෂකයින් කලා උපාධිධාරීන්ගේ විරැකියාව සඳහා බලපාන සාධක හඳුනා ගැනීම සඳහා තම පර්යේෂණවලදී ස්වායත්ත විචල්‍යයන් භාවිතා කර ඇත. ඒ අනුව පහත පරිදි සංකල්පීය රාමුව ගොඩ නගන ලදී.

රූප සටහන 1: සංකල්පීය රාමුව

- වයස
- විවාහකත්වය
- ස්ත්‍රී පුරුෂ බව
- ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය
- පරිගණක සාක්ෂරතාවය
- පන්ති සාමාර්ථ්‍යය
- උපාධි පාඨමාලාව හදාරන ලද මාධ්‍යය
- වෘත්තීය සුදුසුකම්
- නිරත වූ බාහිර ක්‍රියාකාරකම්
- (Covid 19) වසංගතය

→ විරැකියාව

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

**3. දත්ත විශ්ලේෂණය**

කලා උපාධිධාරීන්ගේ විරැකියාවට බලපාන සාධක අධ්‍යයනය කිරීම සඳහා ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක් මගින් දත්ත විශ්ලේෂණය කරන ලදී. මෙම අධ්‍යයනයේදී සේවා වියුක්තිකයකු වීම හා නොවීම වශයෙන් පරායත්ත විචල්‍යය අනුව්‍යාජ විචල්‍යයක් වන බැවින් අරමුණ තෘප්ත කර ගැනීමට ද්විමය ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියක් හරහා දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියෙහි අනුසීහුම ඇගයීම සඳහා හොස්මර් සහ ලෙමෙෂෝව් මිනුම භාවිතා කරන ලදී.

තවද උපාධි පාඨමාලාව සම්පූර්ණ කළ පසු රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය සඳහා ප්‍රජා විද්‍යාත්මක සාධක බලපෑම් කරන්නේද යන්න අධ්‍යයනය කිරීමට කයි වර්ග පරීක්ෂාව යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

මේ අනුව ව්‍යුත්පන්න කර ගන්නා ලද ප්‍රතිපායන ආකෘතිය පහත පරිදි වේ.

වගු අංක 1: ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතියට ඇතුළත් වන විචල්‍ය

| | B | Sig. | Exp(B) |
|---|---|---|---|
| පරිගණක සාක්ෂරතාවය | 0.731 | 0.019 | 1.031 |
| කොවිඩ්:1* | 2.584 | 0.001 | 0.075 |
| වෘත්තීය සුදුසුකම්:1* | 1.33 | 0.035 | 3.782 |
| උපාධි පාඨමාලාව හදාරන ලද මාධ්‍යය:1* | 0.677 | 0.003 | 0.508 |
| පන්ති සාමාර්ථ්‍යය | | 0.046 | |
| පන්ති සාමාර්ථ්‍යය:1* | 0.017 | 0.02 | 1.017 |
| පන්ති සාමාර්ථ්‍යය:2* | 1.279 | 0.044 | 0.278 |
| පන්ති සාමාර්ථ්‍යය:3* | -0.425 | 0.005 | -0.654 |
| ඉංග්‍රීසි සාක්ෂරතාවය | 0.87 | 0.028 | 1.072 |

| | | | |
|---|---|---|---|
| ස්ත්‍රී පුරුෂභාවය:1* | 1.215 | 0.042 | 0.297 |
| විවාහකත්වය:1* | 0.399 | 0.046 | 0.371 |
| ස්ථාවර | 2.569 | 0.029 | 0.571 |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

### *3.2 ප්‍රවර්ධන ප්‍රතිපායන ආකෘතිය*

$$L = ln\left(\frac{Pi}{1 - Pi}\right) = B_0 + B_1X_1 + B_2X_2 + B_3X_3 + B_4X_4 + B_5X_5 + B_6X_6 + B_7X_7 + B_8X_8 + B_9X_9 + B_{10}X_{10}$$

L = 0.571+1.031 පරිගණක සාක්ෂරතාවය + 0.075 කොවිඩ් (1) + 3.782 වෘත්තීය සුදුසුකම් (1) + 0.508 උපාධි පාඨමාලාව හදාරන ලද මාධ්‍යය (1) + 1.017 පන්ති සාමාර්ථය (1) + 0.278 පන්ති සාමාර්ථය (2) - 0.654 පන්ති සාමාර්ථ්‍යය (3) + 1.072 ඉංග්‍රීසි සාක්ෂරතාවය + 0.297 ස්ත්‍රී පුරුෂභාවය (1) + 0.371 විවාහකත්වය (1)

ඒ අනුව පරිගණක සාක්ෂරතාවය එක් ඒකකයකින් වැඩි වන විට කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය රැකියා නියුක්ත වීමට සාපේක්ෂව 1.031කින් වැඩිවේ. එනම් පරිගණක සාක්ෂරතාවය එක් ඒකකයකින් වැඩිවන විට සේවා නියුක්ත වීමේ සම්භාවිතාව 0.51ක්වේ.

කොවිඩ්19 වෛරසයෙහි බලපෑමක් නොමැති තත්ත්වය එක් ඒකකයකින් වැඩි වීමේදී කලා උපාධිධාරීන්ගේ රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය රැකියා වියුක්ත වීමට සාපේක්ෂව 0.075කින් වැඩි වේ. එනම් කොවිඩ්19 වෛරසයේ බලපෑමක් නොවන තත්ත්වය එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.068කින් වැඩි වේ.

වෘත්තීය සුදුසුකම් සහිත වීම එක් ඒකකයකින් වැඩි වන විට රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 3.782කින් වැඩිවේ. එනම් වෘත්තීය සුදුසුකම් සහිත වීම එක් ඒකකයකින් වැඩි වන විට සේවා නියුක්තවීමේ සම්භාවිතාවය 0.79කින් වැඩි වේ.

උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීම එක් ඒකකයකින් වැඩි වන විට සේවා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 0.508කින් වැඩි වේ. ඒ අනුව උපාධි පාඨමාලාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීම එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.34කින් වැඩි වේ.

ප්‍රථම පන්තියේ උපාධියක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 1.017කින් වැඩි වේ. ඒ අනුව ප්‍රථම පන්තියේ උපාධියක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට සේවා නියුක්තවීමේ සම්භාවිතාවය 0.5කින් වැඩි වේ.

දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 0.278කින් වැඩිවේ. ඒ අනුව දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.22කින් වැඩිවේ.

දෙවන පෙළ පහළ සාමාර්ථයක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට රැකියා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 0.654කින් අඩු වේ. ඒ අනුව දෙවන පෙළ පහළ සාමාර්ථ්‍යයක් ලබා ගැනීම එක් ඒකකයකින් වැඩි වන විට සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.39කින් අඩුවේ.

ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 1.072කින් වැඩි වේ. එනම් ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.52කින් වැඩි වේ.

පුරුෂයින් එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 0.297කින් වැඩි වේ. ඒ අනුව පුරුෂයින් එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.23කින් වැඩි වේ.

අවිවාහක බව එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ හවුමා අනුපාතිකය 0.371කින් වැඩි වේ. ඒ අනුව අවිවාහක බව එක් ඒකකයකින් වැඩි වීමේදී සේවා නියුක්ත වීමේ සම්භාවිතාවය 0.27කින් වැඩි වේ.

මෙම අධ්‍යයනයේදී ප්‍රතිපායන ආකෘතියට අදාළ හොස්මර් සහ ලෙමෙෂෝව් සංඛ්‍යාතිය 0.778ක් වූ බැවින් ප්‍රතිපායන ආකෘතියෙහි අනුසීහුම හොඳයැයි නිගමනය කළ හැකිය.

මෙහිදී රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය සහ ප්‍රජා විද්‍යාත්මක සාධක වන වයස, පුම්තිරිභාවය, විවාහකත්වය යන්නෙහි ස්වායත්තතාවයක් පවතින්නේද යන්න පරීක්ෂා කිරීම සඳහා කයි වර්ග පරීක්ෂාවක් සිදු කරන ලදී. ඒ අනුව රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය හා වයස අතර, රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය හා පුම්තිරිභාවය අතර, රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය හා විවාහකත්වය අතර සම්බන්ධතාවයක් පවතීද යන්න Pearsonගේ කයි වර්ග පරීක්ෂාව මගින් පරීක්ෂා කරන ලදී. ඒ අනුව පුම්තිරිභාවයේ සහ රැකියාවක් ලබා ගැනීමට ගතවන කාලය අතර ස්වායත්තතාවය පරීක්ෂා කළ අතර $(x = 13.701, p = 0.187)$ බැවින් එම විචල්‍ය අතර සම්බන්ධතාවයක් නොපවතින බව 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත.

විවාහකත්වය සහ රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීමේදී $(x = 8.946, p = 0.537)$ එම විචල්‍යයන් අතර සම්බන්ධතාවයක් නොපවතින බවට 95%ක විශ්වාස මට්ටමින් පෙන්නුම් කර ඇත.

වයස සහ රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය අතර ස්වායත්තතාවය පරීක්ෂා කිරීමේදී $(x = 35.323, p = 0.942)$ එම විචල්‍යයන් අතර සම්බන්ධතාවයක් නොපවතින බවට 95%ක විශ්වාස මට්ටමකින් පෙන්නුම් කර ඇත.

වගු අංක 2: රැකියාවක් ලබා ගැනීමට ගත වන කාලය හා ප්‍රජා විද්‍යාත්මක සාධක

| කාර්ය සාධනය | කයි අගය | වෙසෙසි අගය | $H_0$ පිළිගනී |
|---|---|---|---|
| පුමිතිරිභාවය | 13.701 | 0.187 | $H_{01}$ පිළිගනී |
| විවාහකත්වය | 8.946 | 0.537 | $H_{02}$ පිළිගනී |
| වයස | 35.323 | 0.942 | $H_{03}$ පිළිගනී |

වෙසෙසි මට්ටම = 0.05

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාව තුළ කලා උපාධිධාරීන්ගේ සේවා නියුක්ති තත්ත්වය සතුටුදායක මට්ටමක නොපවතී. මන්දයත් උපාධි පාඨමාලාව සම්පූර්ණ කර වසර 2-3 දක්වා කාලයක් ගතවන විටත් උපාධිධාරීන්ගෙන් 55%ක් රැකියා විියුක්ති තත්ත්වයෙන් පෙළේ.

මෙම පර්යේෂණයේ ව්‍යුත්පන්න වූ ප්‍රතිඵල මත පදනම්ව කලා උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වර්ධනය කරලීමේ අරමුණ ඇතිව පහත ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කරන්නට යෙදේ. එහිලා මූලික අරමුණ වන්නේ උපාධිධාරීන් හට රැකියාවක් ලබා ගැනීමේදී වඩාත්ම බලපෑම් කරන කලා උපාධිධාරීන් තුළ අඩු වශයෙන් පවතින සාධක සහ ඊට අමතරව අද වන විට සේවා යෝජකයින් උපාධිධාරීන්ගෙන් අපේක්ෂා කරන්නා වූ කුසලතාවන් වර්ධනය කර ගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග දැක්වීමයි.

මෑත වසර කිහිපය තුළම අඛණ්ඩව සමස්ත රැකියා විරහිත උපාධිධාරීන් අතරින් බහුතරය වාර්තා වන්නේ කලා උපාධිධාරීන් ඇසුරිනි. එබැවින් රජය මෙම සේවා වියුක්තිය මගහරවා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. මෑත කාලයේදී සංවර්ධන නිලධාරී තනතුර සඳහා උපාධිධාරීන් බඳවා ගැනීම සිදු කළද, ඒ හරහා රටෙහි ආර්ථික වර්ධනයට උපාධිධාරීන්ට නිසියාකාරව දායක වීමට අවකාශය නොලැබේ. අනෙක් අතට සෑම වසරකම සේවා වියුක්ත කලා උපාධිධාරීන් බහුල තත්ත්වයක සෙවිය යුත්තේ දිගුකාලීන විසඳුම් මිස කෙටි කාලීන විසඳුම් නොවේ. එබැවින් රජය විසින් මෙම කලා උපාධිධාරී සේවා වියුක්තිකයන් රැකියාවක් සඳහා බඳවා ගැනීමට සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

අනෙක් අතට උපාධිධාරීන්ගේ ඉංග්‍රීසි භාෂාව වර්ධනය කරලීමට විශ්වවිද්‍යාල තුළ විවිධ පාඨමාලා ක්‍රියාත්මක කළද, ඒවායින් සැලකියයුතු බලපෑමක් විද්‍යාර්ථීන්ගේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය වර්ධනය කරලීම සඳහා සිදුවී නොමැති බව විද්‍යාර්ථීන්ගෙන් ලබා ගත් තොරතුරු අනුව පැහැදිලි වේ. උපාධි පාඨමාලා ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරීමට සැලැස්වීම තුළින් කලා

උපාධිධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කර ගත හැකි වුවද, කලා පීඨයන් තුළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධි පාඨමාලාව හැදෑරීමට සලසා ඇත්තේ සුලු ප්‍රමාණයක් සඳහා පමණි. එබැවින් උසස් අධ්‍යාපන කටයුතු හා සම්බන්ධ බලධාරීන් විසින් කලා උපාධි පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් හැදෑරීමට අවකාශය සලසා දීම තුළින් කලා උපාධිධාරියාගේ වෙළෙඳපොළ වටිනාකම වැඩි කර ගැනීමට හැකිය.

අනෙක් අතට සියලුම කලා උපාධිධාරීන්ට සීමාවාසික පුහුණුව සඳහා ඉඩ ප්‍රස්ථා විවර නොවීම තුළින්ද, ආයතනික පුහුණුව සඳහා ඉඩ ප්‍රස්ථා සලසා දුන්නද තම විෂය ක්ෂේත්‍රයට අදාළවම පුහුණුවක් ලබා ගැනීමට බොහෝ කලා උපාධිධාරීන්ට අවස්ථාවක් උදා නොවන බැවින්ද, සියලුම කලා උපාධිධාරීන්ට ආයතනික පුහුණුව ලබා ගැනීමට අදාළ බලධාරීන් අවකාශය සැලසිය යුතු අතරම, එම අවස්ථාව ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම උදෙසා අදාළ සේවා ස්ථාන සම්බන්ධීකරණය කර දීම ආදිය සිදු කළ හැකිය.

අනෙක් අතට කලා උපාධිධාරීන්ට තම උපාධි සහතිකයට අමතරව අවශ්‍ය කරන වෘත්තීය සුදුසුකම් හා රැකියා වෙළෙඳපළ පිළිබඳවත්, සේවා යෝජකයින් උපාධිධරයින්ගෙන් අපේක්ෂා කරන්නා වූ සුදුසුකම් පිළිබදවත් දැනුවත් කිරීමට යම් වැඩ පිළිවෙළක් දියත් කළ යුතුය.

අද වන විට සේවා යෝජකයින්, අධ්‍යාපනික සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් වලට අමතරව මෘදු කුසලතා සහ සන්නිවේදන කුසලතා ආදිය සළකා බලන බැවින් ඒවා වර්ධනය කර ගැනීම සඳහාද ක්‍රියාමාර්ග ගත යුතුය. සේවා යෝජකයින් අපේක්ෂා කරන කුසලාතාවන් සපිරි උපාධිධරයෙකු බිහි කිරීම විශ්ව විද්‍යාලවලට සත්‍ය වශයෙන්ම අභියෝගාත්මක විය හැක. විශ්ව විද්‍යාල සිසුන්ට ඔවුන්ගේ බුද්ධිමය කුසලතා පමණක් නොව, සන්නිවේදන කුසලතා, ගැටළු විශ්ලේෂණ කුසලතා, තීරණ ගැනීමේ කුසලතා ආදී කුසලතා සහ වටිනාකම් වලින් සන්නද්ධ උපාධිධාරීන් බිහිකිරීමට නව ඉගැන්වීමේ සහ ඉගෙනීමේ ක්‍රම සමගින් විෂයමාලාව නැවත සකස් කිරීම කළ යුතුය. එමෙන්ම න්‍යායාත්මක දැනුමෙන් පෝෂණය කිරීමට අමතරව ගැටළු මූලික අධ්‍යාපන ක්‍රමයක් තුළින් උපාධිධරයා ප්‍රායෝගිකව සිතීමට හැකි, න්‍යායාත්මක සංකල්ප ප්‍රායෝගිකව අවස්තාවෝචිතව භාවිතා කළ හැකි අයෙක් බවට පත් කිරීමට විශ්ව විද්‍යාල මගින් කටයුතු කළ යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ


රත්නායක, එන්. ජී. (2002).ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති ප්‍රශ්නය විසඳීමේ ක්‍රමෝපායක් වශයෙන් ව්‍යවසායකත්ව සංවර්ධනයෙහි කාර්යභාරය පිළිබඳ විග්‍රහයක්.

Bakkabulindi, F. E. K., Mugagga, A. M, Shopi, J. M., Kabasiita, J. (2015). Application of the Unified Theory of Acceptance and use of

Technology to the use of ICT by Undergraduates in the School of Education. *ix*, 2-94. Retrieved 19th January, 2022, from https://eric.ed.gov

Dagume, M. A. , Gyekye, A. (2016). Determinants of youth unemployment in south Africa. *Environmental Economics, vii*(4), 59-67. Retrieved 16th January, 2022, from https://scholar.google.com

Dundar, H. (2014). *Building the Skills for Economic Growth and Competitiveness in Sri Lanka.* doi:10.1596/978-1-4648-0158-7

Education- Department of Cencus and alInformation,(2019) Retrieved10th November from http://www.statistics.gov.lk/Education/Statistical Information

Edyanto, A., Suki, N., Ahmad, N. B., Hussain, I. A. (2015). The Influence of Campus Environment, Curriculum and Extra-curricular Activity on Employability. Retrieved 19th January, 2022, from https://scholar.google.com

Fares, J.,Tiongson, E. R.,. (2007). Youth Unemployment,Labour Market Transitions, and Scarring: Evidence from Bosnia and Herzegovina. 1-26.

Graduate Output (2015), Retrieved 3rd December, 2021, from http://www.ugc. ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Graduate Output (2016), Retrieved 3rd December, 2021, from http://www.ugc.ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Graduate Output (2017), Retrieved on 3rd December, 2021, from http://www.ugc.ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Graduate Output (2018), Retrieved on 3rd December, 2021, from http://www.ugc.ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Graduate Output (2019), Retrieved on 3rd December, 2021, from http://www.ugc.ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Graduate Output (2020), Retrieved on 3rd December, 2021, from http://www.ugc.ac.lk/downloads/statistics/stat_2016/Chapter%204.pdf.

Gunarathne, G. K. D. L. L., Jayasinghe, C. L., (2021). Factors Affecting Unemployment Duration of the Science and Arts Stream University Graduates, Retrieved on 18th October, 2021, from https://doi.org/10.21467/ajss.8.1.96-120.

Gunarathne, P. S. M., Ramanayake, Panagoda, D. A. (2018).Tracer Study of Graduates Universities in Sri Lanka, University Grants Commission of Sri Lanka Retrieved on 31st September, 2021, from http://www.ugc.ac.lk.

Jayasinghe, D. G. M. S., Suraweera, S. M. B. L. (2020). An Analysis of the Factors Affecting the Graduates' Employability In Case Of Rajarata University of Sri Lanka. *IRE Journals*, *3*(12), 10-24. Retrieved on 19th January, 2022, from https://scholar.google.com

Kadir, J. M. A., Naghavi, N., Subramanium, G. (2020). Unemployment Among Graduates- Is There a Mismatch. *International Journal of Asian Social Science*, *10*, 583-592. doi:10.18488/journal.1.2020. 1010.583.592

Karunarathne, K. M. D. S. D. (2017). Annual Report, Sri LankaLabour Force Survey, Retrieved on 29th August, 2021, from http://www. statistics.gov.lk/Resourse/en/LabourForce/Annual_Report/LFS2019.pdf.

Karunarathne, K. M. D. S. D., Kodikara,K. A. S.,Egodawatte, E. A. A. P. (2019) Annual Report, Sri LankaLabour Force Survey, Retrieved on 29th August, 2021, from http://www.statistics.gov.lk/Resourse/en/ LabourForce/Annual_Report/LFS2019.pdf.

Karunarathne, K. M. D. S. D., Kodikara, K. A. S., Egodawatte, E. A. A. P., Gnanathilaka, W., Deepawansa, M. D. D. D. D., (2020). Annual Report, Sri LankaLabour Force Survey, Retrieved on 29th August, 2021, from http://www.statistics. gov.lk/Resourse/en /LabourForce/ Annual_Report/LFS2019.pdf

Karunarathne, K. M. D. S. D, Senananyake, Sunil, L. M. D. (2018). Annual Report, Sri LankaLabour Force Survey, Retrieved on 29th August, 2021, from http://www.statistics.gov.lk/Resourse/en/LabourForce/ Annual_ Report/LFS2019.pdf.

Kolko, J. (2019).What the job market looks like for today’s college graduates, Retrieved on 10th September, 2021, from https://hbr.org /2019/05/what-the-job-market-looks-like-for-todays-college-graduates.

Mallawarachchi,L.,Peiris,T.S.G. (2020). The Determinants of Unemployment among the Educated Youth in Sri Lanka. *Journal of Economics and Business*, *4*, 1-19. Retrieved on 10th September, 2021 from https:// www. researchgate.net/publication/341068295

Mihiran, M. (2021). Factors Affecting Graduate Employment. Retrieved on 27th August, 2021, from https://www.researchgate.net/publication/351784287_Factors_Affecting_Graduate_Employment

Minsky. (2015). Global Employability University Survey, Retrieved on 07th November, 2021 from http://www.timeshighereducation.com/student/news/best-universities-producing-ready-work-graduates-global-employability-university-survey

Msigwa, R., Kipesha, E.F. (2013). Determinants of Youh unemployment in Developing Countries:Evidences from Tanzania. *Journal of Economics and Sustainable Development, 4*, 67-76. Retrieved on 16th January, 2022, from http://www.iiste.org.

Perera, T. (n.d.). Unemployment In Sri Lanka. 1-12. Retrieved on 21st January, 2022, from http://scholar.google.com

Performance of A/L Candidates, Department of Examination,2020 Retrieved on 5th December, 2021, from https://www.doenets.lk/statistics.

Robinson, A. (2013). The Workplace Relevance of the Liberal Arts Political Science BA and How It Might Be Enhanced: Reflections on an Exploratary Survey of the NGO Sector. 147-153. Retrieved on 24th January, 2022, from www.apsanet.org/teachingaward

Sri Lanka University Statistics,(2020) Retrieved on 29th August, 2021, from https://www.ugc.ac.lk/index.php?option=com_content&view=article&id=2301%3Asri-lanka-university-sttistics-2020&catid=55%3Areports&ltemid=42&lang=en

Sumanasiri, E. (2015). Review of Literature on Graduate Employability. *Journal of Studies in Education, 5*, 75-88. Retrieved on 23rd January, 2022, from http://scholar.google.com.

Terry,D.,Jackson,C. (2020). *Higher Education Facts And Figures.* Retrieved 19th January, 2022, from https://www.universitiesaustralia.edu.eu/publication/higher-education-facts-and-figures-2020/

Trikawala, S. (2015). The Determinents of Entrepreneurial Intention among Academics in Sri Lanka. Retrieved on 20th January, 2022, from https:scholar.google.com

Weligamage, S. (2009). Graduates' Employability Skills: Evidence from Literature Review. 115-125. Retrieved on 19th January, 2022, from https://scholar.google.com